# නාට්‍ය, වේදිකාව, රංගනය සහ මෙල්බර්න්





**ආචාර්ය තරංග දන්දෙනිය**

මතකය යනු හරි අපූරු දෙයකි. සුන්දර මතකය අපි යලි යලිත් සිහිගන්නවා පමණක් නොව, එම සිදුවීම් නැවත විඳීමට හැකි පරිසරයක් ප්‍රතිනිර්මාණය කිරීමටද කැමැත්තෝ වෙමු.

මා කුඩා කළ ගමේ සිට කොළඹට සංක්‍රමණය වූ අප නැවතී සිටියේ අර්ධ නාගරික පරිසරයකය. හීන් ඇලේ ජබුගසා නැටූ තුරුවිල වැවට බයිසිකල් පැද හුලං ගැසූ ට්‍රැක්ටර් ටියුබ් වලින් ඔරු පැදි මම සෑම නිවාඩුවකටම ගමට ගියෙමි. වෙන්දේසි ඉඩමක දැන්වීමක තිබූ ගොයම් කැපූ වෙලක් පසුබිම් කරගත් ගඟක් සහ හිස් බිමක් ඇතුලත් ඡායාරූපයක් දුටු මාගේ පියා අපිටද නොදන්වා ලහියේ ගොස් එම රූපය දැක්වුන ඉඩම් කැබැල්ලට අත්තිකාරමක් ගෙවූ බව දැනගත්තේ පසුවය. රුක්මලේ වූ අප නව නිවස ඉදිවූයේ එම වෙල් සහිත පරිසරය ම පියාට තම ගම් පියස සිහිකල බැවිනි. කල් යෑමේදී එක් එක් කුඹුරු පුරන්වෙන්නට අතහැරුණේ එක් පරම්පරාවක ගොවීන් මිය යෑමත් අනිකුත් වඩා ලාභ වෘත්තීන් සොයා යෑමත් නිසා පමණක් නොව පසුව ඉදි කෙරුන අධිවේගී කුඹුරු ජල දහරා සහ පසද වෙනස් කළ බැවිනි.

එහෙත් මගේ වෙනත් උපක්‍රම තම ඉඩමෙහි පරිසරය වෙනස් කෙරුමට යොදාගන්නා ලදී. නළ ජලය තිබුනද උල්පතක් හසුවන අතින් ඇද නෑම සඳහා ළිඳක් ද, කුරුල්ලන් ලෙහෙනුන් සඳහා කුඩා වදුලක් ද මෙම කුඩා වෙන්දේසි ඉඩමෙහි පවත්වාගෙන යන ලදී. මේ සියල්ල මගින් ඔහු ඔහුගේ මතකය සංතෘප්ත කිරීම පමණක් නොව මගෙන් ගිලිහුන ගමේ පරිසරය සුළු ප්‍රමාණයයෙන් හෝ මටද යලි ලබා දෙන්නට වෑයම් කරන ලදී.

මව් රටෙන් තවත් රටකට ආ අපිද එවන් මතකයන් පොදි බැද ආවෝ වෙමු. දැහැමි හුදකලා මොහොතවල් වලදී ද සතුටු සාමීච්චලදීද බොහෝ පැහැසර මතකයන් අපි නැවත සජ්ජායනා කිරීමට කැමැත්තෝ වෙමු. ඉන්දු නොනැවතී අප දරුවන්ටද එය අත්විඳීමට පරිසරයක් සකස් කෙරුමට ද උත්සාහ කරන්නෝ වෙම්හු.

මව් රට සමග අප නිරන්තරයෙන් සම්බන්ධ කරනා ධාරාවන් ලෙස කෑම සහ කලාව දැක්විය හැකිය. ඇතැම්විට ආප්ප රාත්‍රීන් වැනි රාත්‍රී කෑම සහිත සංගීත නැටුම් වැඩ සටහන් අප අතර ජනප්‍රිය මේ සම්බන්ධතාව හේතුවෙනවා විය හැකිය. මෙයට වසර කිහිපයකට පෙර කුළු බඩු හෝ කෑම ගැනීමට ශ්‍රී ලාංකීය කඩවලට ගිය බොහෝවුන් එකක් ඩොලර් එකක් හෝ දෙකක් වූ සිංහල මෙගා නාටක වල කොටස් සහ හොරට ගැසූ චිත්‍රපට කොපි ගෙන ඒමට ඇබ්බැහි වී තිබුණි. එහෙත් දැන් ඒ තැන අන්තර් ජාලයෙන් එසැනින් මුද්‍රා හරිනා වැඩසටහනක් නැරඹීම දක්වා දියුණු වී ඇත. මේ සියල්ල අතරෙහි සෑම සති අන්තයක්ම කුමන හෝ සංස්කෘතික ආගමික වැඩසටහන්වලින් පිරී ඇත. ඔබ ශ්‍රී ලාංකික ඉසව් සඳහා වූ වෙබ් අඩවියකට පිවිසෙන්නේ නම් ඉදිරි වසරක දවසක් දක්වා දින දැන්වීම් මගින් පිරී ඇතිවා දැකිය හැකිය. ඒවා එලොවට සහ මෙලොවට වැඩ සලසන්නේ යන දෙයාකාරයේම වැඩසටහන් වෙති. මේ බහුතර වැඩසටහන්වල ආකෘතීන් හි රංගකලාවේ ලක්ෂණ අඩංගු වන්නේය.

රාත්‍රී කෑම සාදයන්හිද, කඨින පිංකම් පෙරහැරවල්වලද, ආසන දෙකේ බණෙහිද රංගන කලාවේ මූලික ලක්ෂණය වන ඉදිරිපත් කිරීම ප්‍රේක්ෂාව, ප්‍රේක්ෂකයා සහ අත්දැකීම (රස වින්දනය ද ඇතුලත්) යන කාරනා දක්නට ඇත. මේ ලිපියේ දී අනෙකුන් ගේ සහ මගේ මතකය ඔස්සේ මා සොයා යන්නේ මෙරට වේදිකා හා ඇතැම් ප්‍රසාංගික කලාවන්හි ස්වරූපයෙන් සහ සුවිශේෂී කඩඉම්ය. මේ සියලු ශ්‍රී ලාංකීය සම්බවයකින් යුතු කලා කටයුතු ඇරඹෙන්නේ ශ්‍රී ලාංකීය සංක්‍රමනිකයන්ගේ මෙරට පැමිණීම් රටා සමගින්ය. ශ්‍රී ලංකාවෙන් මෙරටට පැමිණි මුල් සංක්‍රමනිකයෝ යුරෝ ආසියානු සහ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබ ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනත්වයකින් යුතු ඉංජිනේරු වෛද්‍ය මිනින්දෝරු ආදී වෘත්තිකයෝය. අන්තර්ජාතික මට්ටමේ සම්මානනීය කුසලතා පදනමෙන් හැර කලා කරුවන් උදෙසා හිතකර සංක්‍රමනික නීති නොතිබුන බැවින් ඕස්ට්‍රේලියාවට පුරවැසිභාවය වෙනුවෙන් වෘත්තීය කලා කරුවෝ ආවේ අතලොස්සකි. පැමිණියෝහුද වෙනත් සංක්‍රමන සුදුසුකම් කාණ්ඩ යටතේ පැමිණියෝ වෙති. එහෙත් කලාවට සහ සංස්කෘතියට ඇල්ම බැල්ම තිබූ සුළුතරයක්ගේ උත්සාහයන්හි ප්‍රතිඵල අපි අද භුක්ති විදින්නෝ වෙමු.

දශකයකටත් වඩා සංක්‍රමණික අත්දැකීම් මත එදා මෙදා තුර මෙරට ඉදිරිපත් කළ ශ්‍රී ලාංකීය රංග මූලික ක්‍රියාකාරකම් පහත සඳහන් ධාරාවන් යටතේ වර්ග කරනු කැමැත්තෙමි.

පළමු ධාරාවට අයත් වන්නේ ශ්‍රී ලාංකාවේ වෘත්තීය රංග කණ්ඩායමක් මෙරටට පැමිණ ඉදිරිපත් කිරීමයි. එම රංග කණ්ඩායමට ශ්‍රී ලාංකීය පූජා කණ්ඩායමක් හෝ වෘත්තීය සංවිධායකයින් විසින් කරනු ලබන ආරාධනාවක් සහ සංවිධානය කිරීම මත සිදුවන්නකි. ඇතැම්විට ශ්‍රී ලාංකීය නොවන සංවිධාන විසින් එම ආරාධානාව සිදු කරනු අතර එය ඉතාමත් විරල තත්වයකි. එහෙත් 1963 තරම් අතීතයකදී පවා එලෙස වෘත්තීය රංගවේදීහු මෙරටට පැමිණියෝහුය. ප්‍රවීන නර්තන ශිල්පීන් වන චිත්‍රසේන සහ වජිරා යුවල ඕස්ට්‍රේලියානු එලිසබතන් වේදිකා භාරය (Australian Elizabethan Theatre Trust) මගින් අනුග්‍රහය දක්වා 1963 දී මෙරටට ගෙන්වනු ලැබුව සිඩ්නි මෙල්බර්න් පමණක් නොව ටස්මේනියාවේ ප්‍රධාන නගර දෙකෙහිද රංගනයෙහි යෙදුනෝහුය. ඔවුහු නැවත ද වතාවක් Art Council of Australiiy Ceylon Tea Burean හි අනුග්‍රහයෙන් තම Chitrasena Ceylon Dance Ensemble සමග මෙරටට පැමිණ "Adelaid Festival" "Festival of Perth" යන මෙරට පිළිගත් ප්‍රසාංගික උළෙලවල්හි රඟ දක්වා මෙල්බර්න්, සිඩ්නි, කැන්බරා නගරයන්හිද ප්‍රේක්ෂකයින් පිනවන ලදී. එවන් අනුග්‍රහක් මෑතකදී යම් රංග කණ්ඩායමකට නොලැබුණ තරම්ය.

අනෙකුත් සංචාරක කණ්ඩායම් තම සමස්ත කණ්ඩායම සමග හෝ කණ්ඩායමෙන් යම් ප්‍රතිශතයක් ලෙස පැමිණෙන්නෝහුය. අඩුව පිරවන්නේ මෙරටට පැමිණ සිටිනා වෘත්තීය කලා ශිල්පීන් හෝ ප්‍රජාව අතරින් හඳුනාගත් කලා කුසලතා ඇත්තන්ගෙන්ය.

දෙවන ධාරාව ලෙස හඳුනාගත හැක්කේ සංස්කෘතික සහ ආගමික ක්‍රියාකාරකම්හි කොටස් වශයෙන් ප්‍රජාව අතරින්ම ගොඩනැගුනා වූ රංග ක්‍රියාකාරකම්ය. මෙල්බර්න් නුවර සංක්‍රමණික ප්‍රජාවේ රංග කාර්යයන්හි ආරම්භය සඳහා ඉවහල් වූයේ මෙකී ක්‍රියාකාරකම්ය. (මෙය ඉදිරි ලිපියකින් විස්තරාත්මකව සාකච්ඡා කරනු ලැබේ.) මෙම ධාරාවේ නූතන ස්වරූපය දහම් පාසල්, භාෂා පාසල්, නිදහස් උත්සව, අවුරුදු උත්සව, සහ වෙසක්, කඨින පිංකම්, නත්තල් උත්සව ආදීන් හිදී වැඩි වශයෙන් දැකිය හැකිය.

තෙවන ධාරාව වන්නේ මෙරට වාසය කරනා වෘත්තීය සහ නිර්මාණ ලෝලී ප්‍රජාව එක්ව සිදුකරනු ලබන මහජනයා සඳහා විවෘත පොදු රංග මූලික ක්‍රියාකාරකම්ය. ඇතැම් නිර්මාණ ක්‍රියාවන් වාණිජ අරමුණු මුල්කරගෙන පැනනැගෙන්නා වූ අතර තවත් කොටසක් සහභාගිවන්නන්ගේ නිර්මාණාත්මක තෘප්තිය සහ සමාජීය ජීවිතයේ දිගුවක් වශයෙන් ඉදිරිපත් කරනු ලබයි. මේ කොටස් දෙක අතර මැද වූ අනුධාරාවන් ද ඇතැම්විට දක්නට හැකිය.

සිව්වෙනි ධාරාව වන්නේ රංග කලා වැඩමුළු හෝ පෞද්ගලික රංගකලා ආයතනයන් හී ශිෂ්‍ය ශිෂ්‍යාවෝ උදෙසා සිදු කරනු ලබන අභ්‍යාසයන් හි ප්‍රතිඵල ලෙස හෝ ඔවුන්ගේ කුසලතා දියුණු කිරීම උදෙසා කරනු ලබන රංග ක්‍රියාකාරකම්ය.

පස්වන ධාරාව ලෙස මා සලකන්නේ තමාගේ පවුලේ හෝ හිත මිතුරන් ඇසුරෙහි පමණක් සිදු කරනු ලබන නර්තන ගායනා ආදිය ඇතුලත් ප්‍රසාංගික ඉදිරිපත් කිරීම් ය. මේවා පෞද්ගලික රංග ක්‍රියාකාරකම්ය.

මෙයට අමතර තවත් සුවිශේෂී ප්‍රවනතාවයක් දක්නට ඇත. ඒ නම් නිර්මාණකරුවන්ගේ වෘත්තීය සහ පෞද්ගලික අවශ්‍යතා මත ඉදිරිපත් කරනා රංග ක්‍රියාකාරකම්ය. විශේෂයෙන්ම අධ්‍යනය කාර්යයක අවශ්‍යතාවක් වශයෙන් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ මෙයට අයත් වෙති.

මේ ආකාරයෙ නිර්මාණ, මෙරට ප්‍රජාව සමඟද ඇතැම් නිර්මාණ ශ්‍රී ලාංකීය හෝ වෙනත් ජාතික නිර්මාණකරුවන් සමඟ එක්වද සිදුකරනු ලබති. කුමන විදියකින්, කුමන වර්ගයකින් හෝ කුමන ශෛලියකින් මෙම රංග මූලික ක්‍රියාකාරකම් ඉදිරිපත් කළද මේ මහා සංක්‍රමනික ප්‍රජාව අතරින් සහභාගි වන්නේ ඉතාම සීමිත පිරිසකි. ඒස දහා හේතූන් අතර කාලය, රුචිකත්වය, සහ මුදල් හේතුවෙන්නැති අති අන්තයක දින දෙකෙහි පැවැත් වෙන භාෂා වැඩසටහන් සඳදහා නිරන්තරයෙන් සහභාගිවීම පහසු දෙයක් නොවේ. හිතවත්කම් හෝ යම් කණ්ඩායමකට අයත් වීම නිසා හෝ මගහැරීමට නොහැකි වීමෙන් ඇතැම්හු සහභාගි වෙති.

වෘත්තීමය තත්වනේ අඩුවූද මෙයට දශක තුන හතරකට පෙර මෙනුවර ඇරඹි රංග ක්‍රියාකාරකම් දැනට වඩා ප්‍රජා කේන්ද්‍රීය ය. එබැවින්, පුරෝගාමී රංග ක්‍රියාකරුවන්ගේ මතකය ඔස්සේ එම ගමන් මග නැවත කලාපයකින් මම සටහන් කර සිටිමි.